**2011 මාර්තු 31වන දිනෙන්**

**අවසන් වූ මුදල් වර්ෂය සඳහා**

# බීසීසී ලංකා ලිමිටඩ්

# වාර්ෂික වාර්තාව

**2011 මාර්තු 31වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා**

# ආයතනික තොරතුරු

| | |
|---|---|
| **සමාගමේ නම** | **: බීසීසී ලංකා ලිමිටඩ්** |
| **අධ්‍යක්ෂවරු** | : බ්‍රිගේඩියර් එල් එම් තෙන්නකෝන් මහතා (සභාපති)<br>එස් ඩබ්ලිව් සී ජයමිනි මෙය |
| **ලියාපදිංචි කාර්යාලය** | : නො. 21<br>හල්ෆ්ඩෝර්ෆ් මිල්ස්<br>මිරාණියා වීදිය<br>කොළඹ 12. |
| **ලේකම්වරු** | **: සී/ස ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව**<br>ලංකා බැංකු - මර්චන්ට් ටවර් ගොඩනැගිල්ල<br>නො.28, සාන්ත මයිකල් පාර<br>කොළඹ 03. |
| **විගණකවරු** | **: හුලුගල්ල වික්‍රමනායක සහ සමාගම**<br>(වරලත් ගණකාධිකාරීවරු)<br>නො.56, පාගොඩ පාර<br>නුගේගොඩ. |

## දැක්ම

බිම් මට්ටමින් ආරම්භ කර, අපගේ පෙර පැවති කීර්ති නාමය
නැවත ළඟා කර ගැනීම

## මෙහෙවර

අපගේ මෙහෙවර වනාහි, ඉහළම ඉල්ලුමක් සහිත
නිෂ්පාදන පෙළක් සහ වත්මන් වෙළඳපළ මිල ගණන් අනුව
තරඟකාරී මිල පරාසයක් උදාකර ගැනීමයි.

# බීසීසී ලංකා ලිමිටඩ්

## සභාපතිතුමාගේ සමාලෝචනය

## (2011 මාර්තු 31වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා)

### <u>සභාපතිතුමාගේ ප්‍රකාශය</u>

2011 මාර්තු 31වන දිනෙන් අවසන්වූ මුදල් වර්ෂය සඳහා සමාගමේ වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය නියමිත කාලය තුළදී ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

සමාලෝචිත වර්ෂය තුළදී බදුකුලී ආදායම ඇතුළුව ධනාත්මක සමස්ත මුදල් ප්‍රවාහයක් සනිටුහන් කිරීමට බීසීසී ලංකා ලිමිටඩ් වෙත හැකියාව ලැබුණි. කෙසේවෙතත්, විශාල ප්‍රමාණයක සමුච්චිත පොළී වගකීමක් ඉතිරිකර ඇති, අතීතයේදී පැවති මූල්‍ය සහ සම්පත් අවපාලනය හේතුකොටගෙන සමාගම විසින් මෙම වර්ෂය තුළදී පවා අඛණ්ඩව සැළකියයුතු ලෙස පාඩු ලැබීම නොවැළැක්විය හැකිවිය.

සමාගම විසින් මුහුණපාන ලද දුෂ්කරතාවන් සැළකිල්ලට ගනිමින්, පවත්නා ගැටළු මැඩපවත්වා ගැනීම සඳහාත්, බීසීසී ලංකා ලිමිටඩ් සතු ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම සඳහාත් නව ක්‍රමෝපායක් සකස්කරන ලෙස රජය විසින් උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනය වෙත උපදෙස් ලබාදී ඇත. උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයේ වාර්තාවක තීරණ මත පදනම්ව, අංක 11/0308/553/006 හා 2011.01.26 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින්, බීසීසී ලංකා ලිමිටඩ් සතු කර්මාන්තශාලාව පොල් ත්‍රිකෝණයෙහි ස්ථානයකට රැගෙන යාමටත්, බීසීසී ලංකා ලිමිටඩ් සතු ඉඩම විකිණීමෙන් ලද මුදලින් කොටසක් සමාගම යළි පණගැන්වීම සඳහා ආයෝජනය කිරීමට සහ වසර ගණනාවක් තිස්සේ ඉදිරියට රැගෙනවිත් ඇති ණය මුදල් ගෙවාදැමීමටත් තීරණය කරන ලදී.

මහින්ද චින්තන සංකල්පය මගින් මඟ පෙන්වන ලද උපාය මාර්ගික ව්‍යවසාය කළමනාකරණ ආයතනයේ යෝජනාවක් යටතේ සමාගමේ යෝජිත ප්‍රතිව්‍යුහගත කිරීම තුළින් සමාගමේ ඉදිරි ගමන් මඟ සහ සංවර්ධනය තීරණය කිරීමට අපේක්ෂා කෙරෙන අතර, අප විසින් මෙම වාර්තාවේ මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු ආරම්භකර ඇති බැවින් නුදුරු අනාගතයේදී යහපත් ප්‍රතිඵල ලබාගැනීමට බලාපොරොත්තු වන්නෙමු.

රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් මෙන්ම සමාගමේ සේවක පිරිසෙන් ලද මාර්ගෝපදේශකත්වය පිළිබඳව සමාගමේ කෘතවේදය මෙහිලා සඳහන් කිරීමට කැමැත්තෙමි.

අත්සන් කළේ

..................................

ඉංජිනේරු (බ්‍රිගේඩියර්) එල් එම් තෙන්නකෝන්<br>
නිසි බලධාරි<br>
බීසීසී ලංකා ලිමිටඩ්

# සමාගමේ කටයුතු පිළිබඳව
# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

බීසීසී ලංකා ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011 මාර්තු 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන, සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සමඟ වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබ ඇත.

## වර්ෂයේ ප්‍රතිඵල

මුදල් වර්ෂය තුළදී මෙහෙයුම් ලාභය ශ්‍රී ලංකා රුපියල් 462,568.40 කි. සමාලෝචනයට භාජනය වූ මුදල් වර්ෂය තුළදී සමාගම විසින් දරන ලද මූල්‍ය වියදම ශ්‍රී ලංකා රුපියල් මිලියන 23.6ක් විය. සමාගම විසින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 23.6ක ශුද්ධ පාඩුවක් විඳිනු ලැබ ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය ශ්‍රී ලංකා රුපියල් 100,000,000/-ක් වූ අතර සාමාන්‍ය කොටස් ප්‍රමාණය 10,000,000ක් වන සමාගමේ කොටස් හිමිකමෙන් 100%කම අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩුවේ භාණ්ඩාගාර ලේකම්වරයා විසින් දරනු ලබයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

2011 මාර්තු 31වන දිනට බීසීසී ලංකා ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලය පහත දැක්වෙන පරිදි විය.

- මෙරික් ගුණරත්න මහතා
- එච් ඒ එන් එස් කුමාර මහතා

මෙරික් ගුණරත්න මහතා 2011 ජුනි 30 දින සිට ඉල්ලා අස්වී ඇති අතර එච් ඒ එන් එස් කුමාර මහතා 2011 සැප්තැම්බර් 28 දින සිට ඉල්ලා අස්වී ඇත.

බීසීසී ලංකා ලිමිටඩ් වෙත නිසි බලධාරියෙකු පත් කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් 2011 ජූලි 13 දිනැති ලිපිය මගින් ලබාදී ඇති උපදෙස් අනුව, බ්‍රිගේඩියර් එල් එම් තෙන්නකෝන් මහතා පත්කිරීම 2011 ජූලි 01 දින සිට බලපැවැත්වෙන පරිදි 206වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී විධිමත් ලෙස පිළිගන්නා ලදී. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් 2011 සැප්තැම්බර් 28 දිනැති ලිපිය

මගින් එස් ඩබ්ලිව් සී ජයමිනි මහත්මිය බීසීසී ලංකා ලිමිටඩ් අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත/සාමාජික වශයෙන් නම් කරනු ලැබ ඇත.

බීසීසී ලංකා ලිමිටඩ් හි වත්මන් අධ්‍යක්ෂවරු පහත දැක්වෙන පරිදි වේ.

1. බ්‍රිගේඩියර් එල් එම් තෙන්නකෝන් මහතා - සභාපති
2. එස් ඩබ්ලිව් සී ජයමිනි මෙය - අධ්‍යක්ෂ

**ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතා**

අධ්‍යක්ෂවරුන්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 192 වැනි වගන්තියෙහි දැක්වෙන විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇත.

**විගණකවරු**

විශ්‍රාම ගන්නා විගණකවරුන් වන, වරලත් ගණකාධිකාරීවරුන් වන හුලුගල්ල වික්‍රමනායක සහ සමාගම රාජකාරී කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යාමට තම කැමැත්ත පළකර ඇත. ඒ අනුව, 2012 වර්ෂය සඳහා ඔවුන්ව නැවත පත් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂවරුන් විසින් ඔවුන්ගේ පාරිශ්‍රමික පිළිබඳව තීරණය කරනු ඇත.

**සමාගම් ලේකම්වරු**

සමාගම් ලේකම්වරුන් වන සී/ස ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව අදාළ සුදුසුකම් සපුරා ඇති අතර අදාළ රෙගුලාසිවල නියම කර ඇති පරිදි ලියාපදිංචිය ද ලබා ගෙන ඇත.

**ලියාපදිංචි කාර්යාලය**

සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 12, හල්ෆ්ඩෝර්ෆ් මිල්ස්හි පිහිටා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

| | | |
|---|---|---|
| අත්සන් කළේ | අත්සන් කළේ | අත්සන් කළේ |
| **බ්‍රිගේඩියර් එල් එම් තෙන්නකෝන් මහතා** | **එස් ඩබ්ලිව් සී ජයමිනි මෙය** | **සී/ස ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව** |
| සභාපති | අධ්‍යක්ෂ | ලේකම්වරු |

2012 ජනවාරි මස 10වන දිනදීය.

# බීසීසී ලංකා ලිමිටඩ්

බීසීසී ලංකා ලිමිටඩ් සතු ප්‍රධාන නිෂ්පාදන පහසුකම් වනුයේ සබන් කර්මාන්ත ශාලාව, පොල්තෙල් පිරිපහදුව සහ ගුදම් යන්ත්‍රාගාරයයි. මෙම යන්ත්‍රාගාර මගින් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයන්ගේ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

**(1) සබන් කර්මාන්ත ශාලාව**

රෙදි සෝදන සබන්, ඇඟ ගල්වන සබන්, විෂ බීජ නාශක සහ පවිත්‍රකාරක මෙම සබන් කර්මාන්ත ශාලාවෙහි නිෂ්පාදනය කෙරේ. එම නිෂ්පාදන ඒවායෙහි වෙළඳ නාමයන් සමඟ පහත දක්වා ඇත.

(1) ඇඟ ගල්වන සබන් - සඳුන්
සුවේන්ද්‍රා මල් සුවඳැති
සුවේන්ද්‍රා ශාකසාර
හෙල්ත් ජෝයි

(2) රෙදි සෝදන සබන් - සවරින් බාර්
ස්නෝ-වයිට්

(3) විෂබීජ නාශක - ෆයිනෝල්
වැසිකිළි පෝච්චි පිරිසිදුකරණ

(4) පවිත්‍රකාරක - පිඟන් සෝදන දියර
පිඟන් සෝදන කුඩු
අත්සෝදන ද්‍රව්‍ය

(5) එයාර් ෆ්‍රෙෂ්නර්

## (2) පිරිපහදු නිෂ්පාදන

සුදු පොල් තෙල්, කුක්ස් ජෝයි යන වෙළඳ නාම යටතේ පොල් තෙල් මෙම පිරිපහදුවෙහි නිෂ්පාදනය කෙරේ. පහත සඳහන් ඇසුරුම් ප්‍රමාණයන්ගෙන් මෙම නිෂ්පාදන අලෙවි කරනු ලැබේ.

කුක්ස් ජෝයි - මිලි ලීටර් 500, ලීටර් 01, ලීටර් 5, ලීටර් 20

සුදු පොල් තෙල් - මිලි ලීටර් 500, ලීටර් 01, ලීටර් 5, ලීටර් 20

## (3) ගුදම් යන්ත්‍රාගාරය

මෙම ගුදම් යන්ත්‍රාගාරයෙහි, ප්‍රධාන වශයෙන් ගල්කීල (ගල්තාර) ඇසුරුම් කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත සැපයීමට ගුදම් නිෂ්පාදනය කෙරේ. මෙකී වානේ ගුදම්, ලීටර් 200 සහ ලීටර් 210 ධාරිතාවයන්ගෙන් නිෂ්පාදනය කළ හැක. වර්තමානයේදී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගුදම් සහිතව ගල්කීල (ගල්තාර) ආනයනය කරනු ලැබේ. මෙම ගුදම් යන්ත්‍රාගාරය ඉතා පැරණි වන අතර, සේවා දායකයින්ට අවශ්‍ය වන ත්‍රිත්ව දාර කිරීම වැනි පිරිවිතරයන්ට යෝග්‍ය වන පරිදි ගුදම් නිෂ්පාදනය කිරීම සඳහා මෙම ගුදම් යන්ත්‍රාගාරය විකරණය කිරීම සහ අලුත්වැඩියා කිරීම අවශ්‍ය වී ඇත.

# බීසීසී ලංකා ලිමිටඩ්

## 2011 මාර්තු 31දිනට මූල්‍ය ප්‍රකාශ

## පටුන


| | පිටුව |
|---|---|
| විගණකවරුන්ගේ වාර්තාව | **1 - 3** |
| ආදායම් ප්‍රකාශය | **4** |
| ශේෂ පත්‍රය | **5** |
| හිමිකම් වෙනස්වීම  පිළිබඳ ප්‍රකාශය | **6** |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | **7** |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | **8 - 13** |
| මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් | **14 - 25** |

## හුලුගල්ල වික්‍රමනායක සහ සමාගම

දුරකතන අංක: 2810429
56, පාගොඩ පාර
නුගේගොඩ
ශ්‍රී ලංකා
ඊ-මේල්:hwconsultants@sltnet.lk

වරලත් ගණකාධිකාරීවරු

එච්.එස්.ප්‍රනාන්දු F.C.A.; FSCMA; B.Com (Special)
……………………………………………………………..
යූ. හුලුගල්ල B.Sc; F.C.A.
ජ්.ආර්.ජයසේකර F.C.A. (Eng. & Wales) F.C.A.
වී.ආර්. කදිර්ගාමතම්බි A.C.A.

## බීසීසී ලංකා ලිමිටඩ් සාමාජිකයින් වෙත

## ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

## මූල්‍ය ප්‍රකාශ පිළිබඳ වාර්තාව

2011 මාර්තු 31 වැනි දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වසරට අදාළ ආදායම් ප්‍රකාශය, හිමිකම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් ඇතුළත් බීසීසී ලංකා ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශය; සහ විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ අනෙකුත් පැහැදිළි කිරීමේ සටහන් අප විසින් විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශ පිළිබඳ කළමනාකරණයේ වගකීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙකී මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. ෙමම වගකීම වනුයේ: අදාළ වාතාවරණයන් තුළ සාධාරණවන ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීම සහ සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීම සිදුකිරීමේදී ඇතිවූ වංචාවක් හෝ වැරැද්දක් හේතුකොට ගෙන, භෞතික වශයෙන් සාවද්‍ය ප්‍රකාශවලින් වියුක්ත මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ අභ්‍යන්තර පාලන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමයි.

**විගණන විෂය පථය සහ මතය ඉදිරිපත් කිරීමේ පදනම**

අපගේ වගකීම වනුයේ, අපගේ විගණනය පදනම් කර ගෙන මෙකී මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමයි. උක්ත මූල්‍ය ප්‍රකාශ භෞතික වශයෙන් සාවද්‍ය ප්‍රකාශවලින් වියුක්තදැයි සාධාරණ ප්‍රත්‍යක්ෂයක් ලබා ගැනීම උදෙසා අපගේ විගණනය සැලසුම් කර ක්‍රියාත්මක වූයේ අප විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් ප්‍රකාරව සිදු කළ බැවිනි.

මෙකී මූල්‍ය ප්‍රකාශවල සඳහන් වටිනාකම් සහ අනාවරණය කිරීම් සනාථ කෙරෙන සාක්ෂි යොදා ගෙන ඇති ගිණුම්කරණ න්‍යායන් පිළිබඳව සහ කළමනාකරණය විසින් සපයන ලද වැදගත් ඇස්තමේන්තු පිළිබඳව තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශ මගින් හෙළි වන සමස්ත පිළිබිඹුව පිළිබඳ අගය කිරීම යනාදී කරුණු විගණනයකට ඇතුළත් වේ.

අපගේ විගණනයට අවශ්‍ය වූයේ යැයි අපගේ දැනීමේ උපරිමයට හැඟුණු පරිදි අවශ්‍ය සියලුම තොරතුරු සහ පැහැදිලි කිරීම් අප විසින් ලබා ගන්නා ලදී. එබැවින්, අපගේ මතය උදෙසා සරිලන සාධාරණ පදනමක් අපගේ විගණනයෙන් ලද බව අපි විශ්වාස කරන්නෙමු.

**මතය**

**(අ)** මෙම මූල්‍ය ප්‍රකාශයන්ගේ 16වන සහ 18වන සටහන්වලින් අනාවරණය කර ඇති පරිදි, සමාගම විසින් ලබා ගෙන ඇති ණය සහ බැංකු අයිරා සඳහා වාරික පොළී ගෙවීමේදී මූල්‍ය දුෂ්කරතාවලට මුහුණපානු ලබයි.

**(ආ)** සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී සමාගම විසින් අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතා ලැයිස්තුවක් පවත්වාගෙන ගොස් නොමැත.

**(ඇ)** මෙකී මූල්‍ය ප්‍රකාශවල 19 වැනි සටහනෙහි විස්තරකොට ඇති පරිදි, සමාගම සැළකිය යුතු ප්‍රමාණයක පාඩු ලබමින් මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණපාමින් සිටියි. මෙකී කරුණු සහ වෙනත් සාධක මගින්, මෙම සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැකයන් මතු කරනු ලබයි. එහෙත්, සමාගම ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යා නොහැකි වුවහොත් සිදු කළ යුතු, වාර්තාගත වත්කම් ප්‍රමාණයන්ට සහ වගකීම් වර්ගීකරණයට අවශ්‍යවිය හැකි ගැලපීම් සිදු නොකර ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පවත්වාගෙන යා හැකිය යන පදනම මත මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඇත. 2011 මාර්තු 31 දිනට සමාගමේ සමුච්චිත පාඩුව රු.224,789,944.59 ක් විය. තවද, ශේෂ පත්‍රයේ දිනට සමාගමේ ජංගම වගකීම් ප්‍රමාණය ජංගම වත්කම් ප්‍රමාණයට වඩා රු.225,924,789.25 කින් වැඩිය. මෙම කරුණු හේතුකොට ගෙන, වාර්තාගත වත්කම් ප්‍රමාණයන්ට සහ වගකීම් වර්ගීකරණයට ගැලපීම් කිරීම අවශ්‍යවිය හැක. එවැනි කිසිඳු ගැලපීමක් මෙකී මූල්‍ය ප්‍රකාශයන්ට ඇතුළත්කර නොමැත. තවද, මෙම ගිණුම් මගින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 220 වැනි වගන්තිය උල්ලංඝනය කරනු ලැබේ.

එහෙත්, අක්කර 12, රූඩ් 03, පර්චස් 8.77 ක ප්‍රමාණයෙන් යුතු කොළඹ 12, මීරාණියා වීදියේ, හල්ෆ්ඩෝර්ෆ් මිල්ස් හි වරිපනම් අංක 21 දරන දේපළ බීසීසී ලංකා ලිමිටඩ් වෙත අයිතිව පවත්නා බව අවධානයට ලක්කළ යුතුයි. මෙම දේපළ ප්‍රතිප්‍රමාණයකර නොමැත. මෙම දේපළෙහි වෙළඳපල වටිනාකම රු. බිලියන4 අභිබවා යා හැකිය.

**(ඇ)** පහත සඳහන් ශේෂයන් සම්බන්ධයෙන් තහවුරු කිරීම් අප වෙත ලැබී නොමැත.

| | රු. | |
|---|---|---|
| ජන.ව.ස.ම. ණය | 4,508,696 | (ණයහිමියෙකි) |
| වෙළඳ ණයගැතියෝ (ශුද්ධ) | 9,257,346 | (ණයගැතියෙකි) |
| සී/ස කලුබෝවිටියාන තේ සමාගමේ ණය | 24,941,667 | (ණයහිමියෙකි) |
| වෙළඳ ණය හිමියෝ | 29,777,464 | (ණයහිමියෙකි) |
| ලංකා බැංකුව | 54,190 | (ණයගැතියෙකි) |

**(ඉ)** සමාගම විසින් පිරිවැටුම් බද්ද, ආරක්ෂක බද්ද, භාණ්ඩ හා සේවා බද්ද, අගය එකතු කළ බද්ද සහ වරිපනම් හා බදු වලින් පැන නගින්නාවූ වගකීම් නියමිත දිනට පියවා නොමැත.

| | රු. |
|---|---|
| - පිරිවැටුම් බද්ද | 141,279.00 |
| - ආරක්ෂක බද්ද | 1,079,761.95 |
| - භාණ්ඩ හා සේවා බද්ද | 1,279,509.00 |
| - වරිපනම් හා බදු | 21,414,470.00 |
| - අගය එකතු කළ බද්ද | 33,836,598.52 |

අපගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට, ඉහත සඳහන් පූර්ව (අ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කොට ඇති කරුණු සම්බන්ධයෙන් අවශ්‍යයැයි හැඟීගිය තැනකදී තීරණය කරනු ලැබ ඇති, මූල්‍ය ප්‍රකාශන මත වන බලපෑම හැර 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ඇති බවත්, අප වෙත සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, 2011 මාර්තු 31 දිනට සමාගමේ කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි පැවති අලාභය සහ මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් 2007 අංක 07 දරන සමාගම් පනතින් නියමකොට ඇති තොරතුරු ලබාදෙමින් උක්ත පොත්පත්වලට එකඟව උක්ත ශේෂ පත්‍රය සහ අදාළ ආදායම් ප්‍රකාශ, මුදල් ප්‍රවාහය හා හිමිකම්වල වෙනස්වීම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා එහි සටහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව පිළියෙළකර ඉදිරිපත් කර ඇති බවත්, අප දරන්නාවූ මතය වේ.

## සමාගම් ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ සම්බන්ධතා

ගිණුම් සටහන් 23හි සඳහන් පරිදි හැර, අප වෙත ලබාදුන් තොරතුරුවලට අනුව, 2011 මාර්තු 31 දිනෙන් අවසන්වූ වර්ෂය තුළදී සමාගමේ අධ්‍යක්ෂවරු ඍජුව හෝ වක්‍රව සමාගම සමඟ ගිවිසුම්වලට සම්බන්ධතාවක් නොදැක්වූ බව ප්‍රකාශ කළ හැකිය.

## වෙනත් නෛතික සහ නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

අප වාර්තාවේ විගණක සටහන් (ආ) සහ (ඉ) හි දක්වා ඇති පරිදි හැර මෙකී මූල්‍ය ප්‍රකාශ 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 (2) වගන්තියේ නියමයන්ට අනුකූල වේ.

**හුලුගල්ල වික්‍රමනායක සහ සමාගම**
**වරලත් ගණකාධිකාරීවරු**
**කොළඹ**
2012 අප්‍රේල් 27

හුලුගල්ල වික්‍රමනායක සහ සමාගම
වරලත් ගණකාධිකාරීවරු

විගණක වාර්තාවේ ඉතිරිය…04..

## බීසීසී ලංකා ලිමිටඩ්
### ආදායම් ප්‍රකාශය
### 2011 මාර්තු 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

**(අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, සියලුම ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)**

| | සටහන් | 2010/11 | 2009/10 |
|---|---|---|---|
| ශුද්ධ ආදායම | 01 | 105,501,644.37 | 9,570,210 |
| විකුණන ලද භාණ්ඩවල පිරිවැය | 02 | (75,303,993.77) | (75,486,007) |
| **දළ ලාභය / (පාඩුව)** | | 30,197,650.60 | 24,084,203 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 03 | - | 642,857 |
| පරිපාලන වියදම් | 04 | (26,342,830.92) | (27,413,257) |
| විකිණීමේ සහ බෙදාහැරීමේ වියදම් | 05 | (3,392,251.28) | (3,566,666) |
| **මෙහෙයුම් ලාභය/ (පාඩුව)** | | 462,568.40 | (6,252,862) |
| මූල්‍ය වියදම් | 06 | (23,647,404.47) | (26,589,495) |
| **බදුකරණයට පෙර පාඩුව** | | (23,184,836.07) | (32,842,357) |
| බදුකරණය | 07 | - | - |
| **අවුරුද්දේ ශුද්ධ පාඩුව** | | (23,184,836.07) | (32,842,357) |

පිටු අංක 08 සිට 13 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 14 සිට 25 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංයුක්ත කොටසකි.

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

# බීසීසී ලංකා ලිමිටඩ්

## 2011 මාර්තු 31 වන දිනට ශේෂ පත්‍රය

**(අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, සියලුම ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)**

| | සටහන් | 2010/11 | 2009/10 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ | 08 | 15,862,379.30 | 19,589,747 |
| අස්පෘෂ්‍ය වත්කම් | 09 | 252,001,153.00 | 252,001,153 |
| ආයෝජන | 10 | 23,000.00 | 23,000 |
| | | 267,886,532.30 | 271,613,900 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | 11 | 12,700,202.30 | 12,518,560 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතුදෑ | 12 | 31,976,165.60 | 30,760,109 |
| මුදල් හා මුදල් සාමාන්‍යයන් | 13 | 12,958,856.80 | 11,349,737 |
| | | 57,635,224.70 | 54,628,405 |
| **මුළු වත්කම්** | | **325,521,757.00** | **326,242,305** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **හිමිකම් ප්‍රාග්ධනය සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 14 | 100,000,000.00 | 100,000,000 |
| රඳවාගත් ඉපැයීම් | | (224,789,944.59) | (689,385,197) |
| | | (124,789,944.59) | (589,385,197) |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 15 | 3,359,597.88 | 2,555,718 |
| පොළියක් දරන ණය සහ ණය ගැනීම් | 16.1 | 163,392,089.76 | 642,678,172 |
| | | 166,751,687.64 | 645,233,889 |
| **ජංගම වගකීම්** | | | |
| පොළියක් දරන ණය සහ ණය ගැනීම් | 16.2 | 147,915,146.81 | 138,071,191 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 17 | 96,066,636.17 | 95,507,936 |
| බැංකු අයිරා | 18 | 39,578,230.97 | 36,814,486 |
| | | 283,560,013.95 | 270,393,613 |
| **මුළු වගකීම්** | | 450,311,701.59 | 915,627,502 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **325,521,757.00** | **326,242,305** |

මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ,

2007 අංක 07 දරන සමාගම් පනතේ 151(2) වගන්තියේ නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇතිබව මම සහතික කරමි.

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

| ---------------------------------- | ---------------------------------- | ---------------------------------- |
|---|---|---|
| සභාපති | අධ්‍යක්ෂ | ගණකාධිකාරී |
| දිනය | දිනය | දිනය |

## බීසීසී ලංකා ලිමිටඩ්

**හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය**

**2011 මාර්තු 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**(අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, සියලුම ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)**

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | සමුච්චිත ලාභය/ පාඩුව | එකතුව |
|---|---|---|---|
| 2009 අප්‍රේල් 01වන දිනට පැවති ශේෂය | 100,000,000.00 | (742,690,368.56) | (642,690,368.56) |
| වර්ෂයේ ශුද්ධ පාඩුව | - | (32,842,357.38) | (32,842,357.38) |
| පෙර වර්ෂයේ ගැලපීම | - | 86,147,529.42 | 86,147,529.42 |
| **2010 මාර්තු 31වන දිනට පැවති ශේෂය** | 100,000,000.00 | (689,385,196.52) | (589,385,196.52) |
| වර්ෂයේ ශුද්ධ පාඩුව | - | (23,184,836.07) | (23,184,836.07) |
| කපා හරින ලද භාණ්ඩාගාර ණය - **( 16.1.2 )** | - | 487,780,088.00 | 487,780,088.00 |
| **2011 මාර්තු 31වන දිනට පැවති ශේෂය** | 100,000,000.00 | (224,789,944.59) | (124,789,944.59) |

පිටු අංක 08 සිට 13 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 14 සිට 25 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංයුක්ත කොටසකි.

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

# බීසීසී ලංකා ලිමිටඩ්

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2011 මාර්තු 31වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා**

**(අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, සියලුම ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)**

වරහන් තුළ ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දැක්වේ.

| | සටහන් | | 2010/11 | 2009/10 |
|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් ඉපැයූ මුදල් ප්‍රවාහය** | | | | |
| බදුකරණයට පෙර ශුද්ධ ලාභය | | | (23,184,836) | (32,842,357) |
| **ගැලපීම්:** | | | | |
| ක්ෂයවීම් සඳහා | 04 | 3,944,350 | | 3,899,368 |
| පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා | 15 | 803,880 | | 965,913 |
| කල්බදු පොළිය සඳහා | 06 | 924,979 | | 1,229,082 |
| මෝටර් රථ අපහරණයෙන් ලද ලාභය | 03 | - | | (642,857) |
| ණය පොළිය | 06 | 19,785,911 | | 22,459,024 |
| | | | 25,459,120 | 27,910,529 |
| කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව) | | | 2,274,284 | (4,931,828) |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | | | |
| භාණ්ඩ තොග අඩුවීම / (වැඩිවීම) | 11 | (181,642) | | 13,678,047 |
| අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම / (වැඩිවීම) | 12 | (1,216,057) | | (4,055,682) |
| අනෙකුත් ගෙවිය යුතු දෑ අඩුවීම/ (වැඩිවීම) | 17 | 558,700 | (838,999) | (130,120) |
| **මෙහෙයුම් කටයුතුවලින් ඉපැයූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | 1,435,285 | 4,560,417 |
| **ආයෝජන කටයුතුවලින් ඉපැයූ මුදල් ප්‍රවාහය** | | | | |
| දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ අත්පත් කරගැනීම | 08 | (216,982) | | (448,525) |
| දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ අපහරණය | 03 | - | | 642,857 |
| ආයෝජන කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | | (216,982) | 194,332 |
| | | | 1,218,303 | 4,754,749 |
| **මූල්‍ය කටයුතුවලින් ඉපැයූ මුදල් ප්‍රවාහය** | | | | |
| ගෙවූ කල්බදු වාරිකය | | (2,372,928) | | (2,372,928) |
| මූල්‍ය කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | | (2,372,928) | (2,372,928) |
| වර්ෂය තුළ ශුද්ධ මුදල් වැඩිවීම / (අඩුවීම) | | | (1,154,625) | 2,381,821 |
| වර්ෂය ආරම්භයේදී පැවති ශුද්ධ මුදල් සහ මුදල් සාම්‍යයන් | | | (25,464,749) | (27,846,570) |
| **වර්ෂය** අවසානයේදී පැවති ශුද්ධ මුදල් සහ මුදල් සාම්‍යයන් | | | (26,619,374) | (25,464,749) |
| **මූල්‍ය ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සාම්‍යයන්** | | | | |
| අතැති මුදල් | 13 | | 12,958,857 | 11,349,737 |
| බැංකු අයිරා | 18 | | (39,578,231) | (36,814,486) |
| | | | (26,619,374) | (25,464,749) |

## බීසීසී ලංකා ලිමිටඩ්
## විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී පිළිගනු ලැබූ ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ:

### 1. ආයතනික තොරතුරු

#### 1.1 ලියාපදිංචිය සහ නෛතික තත්ත්වය

බීසීසී ලංකා ලිමිටඩ් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කොට සංස්ථාගත කොට ඇති සීමාසහිත වගකීමැති සමාගමකි. ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ කොළඹ 12, මිරාණියා වීදිය, හල්ෆ්ඩෝර්ෆ් මිල්ස් යන ස්ථානයේය.

#### 1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සිදුකරන ලද ප්‍රධාන කාර්යයන් පහත සඳහන් පරිදි වේ.

- පොල්තෙල් වෙළඳාම
- ඇඟ ගල්වන සබන්, රෙදි සෝදන සබන්, පවිත්‍රකාරක සහ වැසිකිළි සඳහා අවශ්‍යදෑ නිෂ්පාදනය කිරීම සහ වෙළඳාම
- ගුදම් නිර්මාණය කිරීම හා ගල්තාර වෙළඳාම

### 2. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1 අනුකූලත්වය පිළිබඳ ප්‍රකාශය

පහත සඳහන් දෑ හැර, 2011 මාර්තු 31වන දිනට සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ("මූල්‍ය ප්‍රකාශ") සමඟ, ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශය, හිමිකම්වල වෙනස්වීම් සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.

- භාණ්ඩ ලේඛනයේ ශේෂය, පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු අගය අනුව ප්‍රකාශ කළ යුතු බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05 න් නියම කොට ඇත. 2011 මාර්තු 31වන දිනට සමාගමේ භාණ්ඩ ලේඛන ශේෂයෙහි පිරිවැය අගය මත ගණනය කළ යල්පිනූ භාණ්ඩවල කැපී පෙනෙන ශේෂයක් අන්තර්ගත වුවත්, එකී භාණ්ඩ තොගවල ශුද්ධ උපලබ්ධි වටිනාකම සැළකිය යුතු ප්‍රමාණයක අඩු අගයක් ගනියි.

- ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනීම සඳහා අත්පත් කරගැනීමෙන් හටගත්තාවූ කීර්තිනාමය කපාහරින ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 25 න් නියම කොට නැත.

#### 2.2 සකස්කිරීමේ පදනම

අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කොට ඇති මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කොට ඇත්තේ උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය නියමයට අනුකූලවය.

**බීසීසී ලංකා ලිමිටඩ්**
**විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉතිරිය.....**

**2.3 සංසන්දනාත්මක තොරතුරු**

සමාගම විසින් යොදාගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති, අන්‍යාකාරයකින් සඳහන් කොට නොමැත්තේ නම්, පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනුරූපී වේ. පවත්නා වර්ෂයේ ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය තැන්හිදී, පෙර වර්ෂවල සංඛ්‍යා සහ වාක්‍ය සටහන් නැවත පිළියෙල කරනු ලැබ ඇත.

**2.4 ශේෂ පත්‍රයෙන් පසුව හටගත් සිද්ධීන්**

ශේෂ පත්‍රයෙන් පසුව හටගත් සියලුම භෞතික සිද්ධීන් සළකා බලනු ලැබ ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 22 හි, ඒ සඳහා සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදුකර ඇත.

**3. වත්කම් සහ ඒවා තක්සේරු කළ පදනම්**

**3.1 දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ**

දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණ සඳහන් කර තිබෙන්නේ රජයට අයත් ව්‍යාපාරික ආයතනයක් වන "බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන්" ආයතනයට වූ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙනි. දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණවල පිරිවැය යනු ඒවායේ මිළදී ගැනුම් පිරිවැය හෝ ඉදිකිරීම් පිරිවැය වන අතර ඒවා අත්පත්කර ගැනීමේදී දරන්නට සිදුවූ යම් ආනුෂංගික වියදමක් වූයේ නම් එයද ඇතුළත්වය.

ක්ෂයවීම් ගණනය කර ඇත්තේ රජයට අයත් ව්‍යාපාරික ආයතනයට වූ පිරිවැයෙන් සරල රේඛීය ක්‍රමයට දේපළ, යන්ත්‍රාගාර සහ උපකරණවල පිරිවැයෙහි භාවිත ආයුකාලයේ අපේක්ෂිත අගය කපාහැරීමේ පදනමිනි.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලීබඩු සහ සවිකුරු | 25% |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍රසූත්‍ර | 10% |
| මෝටර් රථ | 25% |
| මෙවලම් සහ උපකරණ | 25% |
| කාර්යාලීය උපකරණ | 25% |

මිලදී ගත් වර්ෂයේදී කිසිදු ක්ෂය කිරීමක් සිදු නොකරන අතර අපහරණය කිරීමේ වර්ෂයේදී, මුළු වර්ෂය සඳහාම ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

**3.2 අස්පෘශ්‍ය වත්කම් - කීර්තිනාමය**

කීර්තිනාමය නියෝජනය වන්නේ, ව්‍යාපාරය සමාගමක් බවට පරිවර්තනය කළ දිනට, එසේ සමාගමක් බවට පරිවර්තනය කරන ලද ව්‍යාපාරයේ හඳුනාගත හැකි වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය බැරකම්වල සාධාරණ වටිනාකම මත සමාගමේ නිකුත්කළ කොටස් ප්‍රාග්ධනයේ අතිරික්තයෙනි.

**බීසීසී ලංකා ලිමිටඩ්**
**විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉතිරිය.....**

### 3.3 ආයෝජන

ආයෝජන දිගු කාලීන ස්වභාවයෙන් යුතුවන අතර, ප්‍රකාශ කොට ඇත්තේ පිරිවැය අගය මතය. මෙම ආයෝජනවල වටිනාකම පහත හෙළීම සඳහා කිසිඳු ගැලපීමක් සිදු කර නොමැත. මෙම ප්‍රමාණය ඉදිරියට ගෙනයන ලදී.

### 3.4 භාණ්ඩ තොග

භාණ්ඩ තොග දක්වා ඇත්තේ පිරිවැයටය. සමාගම විසින් භාණ්ඩ තක්සේරු කිරීම සඳහා ප්‍රථම ලැබුම ප්‍රථම නිකුතුව යන පදනම පිළිගනු ලැබේ. ප්‍රතිපාදනයක් අවශ්‍ය යල්පිනූ භාණ්ඩ ඇතුළත් භාණ්ඩ ලේඛනයක එම භාණ්ඩ සැළකිය යුතු ප්‍රමාණයක් ඇති තැන්හිදී, යල්පිනූ, මන්දගාමී සහ පළුදුවූ භාණ්ඩ වෙනුවෙන් රු.75,830 ක ප්‍රතිපාදනයක් සපයා ඇත.

### 3.5 වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතුදෑ

වෙළඳ සහ ලැබිය යුතු දෑ දක්වා ඇත්තේ, බොල් සහ අඩමාණ වශයෙන් ලැබිය යුතු මුදල් සඳහා කර ඇති ප්‍රතිපාදනවල ශුද්ධ අගය උපලබ්ධි කර ගැනීම සඳහා ඒවා ඇස්තමේන්තු කළ වටිනාකම්වලටය.

### 3.6 මුදල් සහ මුදල් සාම්‍යයන්

මුදල් සහ මුදල් සාම්‍යයන් සමන්විත වන්නේ බැංකුවේ පවත්නා සහ අතැති මුදල්වලිනි. ඉල්ලුවිට ආපසු ගෙවිය යුතු සහ සමාගමේ මුදල් කළමනාකරණයේ ආවශ්‍යක කොටසක් බවට පත් වන බැංකු අයිරා, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් සහ මුදල් සාම්‍යයන්ගේ සංරචකයක් වශයෙන් ඇතුළත් කොට ඇත.

## 4. වගකීම් සහ ප්‍රතිපාදන

### 4.1 වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ

වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ දක්වා ඇත්තේ ඒවායෙහි පිරිවැයටය.

### 4.2 ප්‍රාග්ධන බැදීම් සහ අසම්භාව්‍ය සිද්ධීන්

ශේෂපත්‍ර දිනයට ප්‍රාග්ධන වියදම් සම්බන්ධ බැදීම් සහ අසම්භාව්‍ය බැරකම්, මූල්‍ය ප්‍රකාශයන්හි අදාළ සටහන්වල අනාවරණය කොට ඇත.

**බීසීසී ලංකා ලිමිටඩ්**
**විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉතිරිය.....**

**4.3 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය**

**4.3.1 නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික**

පාරිතෝෂික යනු නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීමට සමාගම බැඳී සිටී. මෙම වගකීම සපුරාලනු වස්, සේවය ආරම්භකළ පළමු වර්ෂයේ සිට සම්පූර්ණ කරන ලද සෑම වර්ෂයක් සඳහාම, සෑම සේවකයකුටම අදාළ ඒ ඒ මුදල් වර්ෂයේ අවසන් මාසයේ මාස භාගයක වැටුප මත පදනම්ව ගණනය කරන ලද ප්‍රමාණයකට සමාන ප්‍රතිපාදනයක් ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන ගොස් ඇත. වර්ෂයක් ආරම්භයේදී ඉදිරියට රැගෙනආ ප්‍රතිපාදනය සහ වර්ෂයක් අවසානයේදී ඉදිරියට ගෙන යනු ලබන ප්‍රතිපාදනයන් අතර හට ගන්නා වෙනස ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇත.පාරිතෝෂික වගකීම සඳහා අරමුදල් ලබාදීමක් හෝ නිසි ආයු ගණනයක් හෝ සිදු කර නොමැත. මෙම අයිතමය ශේෂ පත්‍රයේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් යටතේ වර්ගීකරණයකොට ඇත.

**4.3.2 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල**

සියලුම විධායක කාර්ය මණ්ඩලය සහ කාර්යාලීය කාර්ය මණ්ඩලය බීසීසී කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර අනෙකුත් සේවකයන්, සමාගම විසින් එම සේවකයින්ගේ දළ වැටුප්වලින් පිළිවෙලින් 15%ක සහ 3% ක දායකත්වයක් ලබා දෙන්නාවූ සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා සුදුසුකම් ලබා ඇත.

සියලුම සේවකයින් ආවරණය කරන්නාවූ අර්ථසාධක සහ භාරකාර අරමුදල් සඳහා වන දායකත්වයන් වෙනුවෙන් පවත්නා වගකීම් දැරූ අවස්ථාවේදී, ලාභයේ හෝ පාඩුවේ වියදමක් වශයෙන් හඳුනාගෙන ඇත.

**4.3.3 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් සමාගමක නෛතික හෝ අර්ථකාරී වගකීමක් ඇතිවිට ප්‍රතිපාදන වෙන් කිරීම් සිදු කරනු ලබන අතර එම වගකීම පියවා දැමීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාමක් අවශ්‍යවනු ඇතැයි පෙනී ගොස් ඇත.

**5. ආදායම් ප්‍රකාශය**

**5.1 අයභාරය**

සමාගමේ පිරිවැටුම මගින් භාණ්ඩවල ඉන්වොයිසි වටිනාකම, වෙළඳ වට්ටම් සහ විකුණුම් ප්‍රතිලබ්ධිවල ශුද්ධ වටිනාකම දැක්වේ.

**5.2 අයභාරය හඳුනා ගැනීම**

ආර්ථික ප්‍රතිලාභය සමාගම වෙත ගලාඑනු ඇතැයි හැඟී යන සහ අයභාරය නිශ්චිතව මැනිය හැකි වන ප්‍රමාණය දක්වා අයභාරය හඳුනාගෙන ඇත.

**බීසීසී ලංකා ලිමිටඩ්**
**විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉතිරිය.....**

**5.3 වියදම හඳුනාගැනීම**

වර්ෂය සඳහා ලාභය හෝ පාඩුව ගණනය කිරීමේදී, ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම ලෙසින් නඩත්තු කිරීමේදී දැරූ වියදම ආදායමෙන් අයකරගෙන ඇත.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස වන්නේ, වියදම් ක්‍රමයේ ක්‍රියාකාරිත්වය මගින් සමාගමේ කාර්යසාධනයේ ප්‍රභවයන් සාධාරණලෙස ඉදිරිපත් කරනු ලබන බවයි. එබැවින්, එවැනි ඉදිරිපත් කිරීමේ ක්‍රමයක් යොදාගෙන ඇත.

## 6. ප්‍රාග්ධන බැඳීම්

ව්‍යාපාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අරමුණින් ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමේදී, දීර්ඝ කිරීමේදී හෝ වැඩිදියුණු කිරීමේදී හෝ ව්‍යාපාරයේ ඉපැයුම් ධාරිතාව වැඩිකිරීම සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සළකා ඇත.

## 7. ණයට ගැනීමේ පිරිවැය

ණයට ගැනීමේ පිරිවැය හඳුනාගෙන ඇත්තේ, ඒවා දරන ලද කාල පරිච්ඡේදය තුළ වියදමක් වශයෙනි. නැතහොත් යෝග්‍යතා වත්කම් සම්බන්ධයෙන් ප්‍රාග්ධනායනය කරනු ලැබූ අවස්ථාවේදී එකී පිරිවැය දරන ලද කාල පරිච්ඡේදය තුළ වියදමක් වශයෙනි.

## 8. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

"වක්‍ර ක්‍රමය" භාවිත කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස්කොට ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් සහ මුදල් සාම්‍යයන්හි අන්තර්ගත වන්නේ අතැති මුදල්, බැංකුවල තැන්පත් කොට ඇති මුදල් සහ ගෙවිය යුතු බැංකු අයිරාවල ශුද්ධ වටිනාකමත්ය.

වක්‍ර ක්‍රමය මත පදනම්ව වාර්තා කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේදී, ගෙවූ පොළිය මෙහෙයුම් මුදල් ප්‍රවාහ වශයෙනුත්, ලැබූ පොළිය ආයෝජන මුදල් ප්‍රවාහ වශයෙනුත්, ගෙවූ ලාභාංශ මූල්‍ය මුදල් ප්‍රවාහ වශයෙනුත් වර්ගීකරණය කොට ඇත.

**බීසීසී ලංකා ලිමිටඩ්**
**විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉතිරිය.....**

## 9. බදුකරණය

### 9.1 ප්‍රවර්තන බදු

ඉදිරියට රැගෙන ආ බදු සඳහා වන පාඩු හේතු කොටගෙන මෙම වර්ෂය තුළ බදුකරණය සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත.

### 9.2 විලම්භීත බදුකරණය

සමාගම විසින් බදු සඳහා දරන ලද පාඩු හේතුකොටගෙන සමාගම විසින් මේ සම්බන්ධයෙන් කිසිඳු ප්‍රතිපාදනයක් සිදුකර නොමැත.

## 10. ආශ්‍රිත පාර්ශ්වයන්ගේ ගණුදෙනු

